216	සමාජ සේවා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	5,889,672.12	5,837,912.76	99.12
217	පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	260,390.00	248,270.00	95.35
219	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	2,338,165.50	2,292,933.50	98.07
226	ආගමන විගමන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	14,340.00	14,340.00	100.00
227	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	9,111,917.09	8,881,071.29	97.47
243	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	4,998,000.00	4,458,943.07	89.21
252	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	2,048,739.47	1,916,691.22	93.55
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	43,133,986.80	42,844,255.53	99.33
284	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	37,018,802.00	36,869,644.75	99.60
286	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	34,437,991.00	26,848,371.44	77.96
303	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	558,000.00	558,000.00	100.00
307	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	2,177,661.00	2,114,975.77	97.12
326	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	153,000.00	148,760.00	97.23
327	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	216,122.00	167,898.00	77.69
328	මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	413,242.55	361,287.14	87.43

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (භාණ්ඩාර මුද්‍රිත සටහන් අනුව)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි ව්‍යුහයන්	722,967,640.80	722,967,640.80	-	100%
9152	යන්ත්‍රෝපකරණ	347,464,959.22	347,464,959.22	-	100%
9153	ඉඩම්	206,476,600.00	206,476,600.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	1,916,601,920.95	1,916,601,920.95	-	100%
9080	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපති වාර්තාව**


පරිලෝකනය කර මෙහි අවසානයට අමුණා ඇත.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
කාර්යාලීය ඉඩ පහසුකම් වැඩි කිරීමෙන් කාර්යය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම	√		
කාර්යමණ්ඩලයේ හා මහජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් ඉහළ නැංවීම	√		
නව යන්ත්‍ර සහ කාර්යාල උපකරණ සැපයීමෙන් කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම	√		
නිලධාරීන් පුහුණු කිරීම තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම	√		

කාර්යාලීය ඉඩ පහසුකම් වැඩි කිරීම





කළමනාකරණ සේවා නිලධාරීන් (1 ශ්‍රේණිය) සඳහා පැවැත්වූ සේවාස්ථ පුහුණුව





05.පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
සියළු ආකාරයේ දිළිඳු බව, සියළු තැන්හිම දුරු කිරීම	2024 වර්ෂයේ අඩු ආදායම් ලාභීන් සඳහා අස්වැසුම ආධාර/ සමෘද්ධි ආධාර/වකුගඩු ආධාර/ ආබාධිත දීමනා/වයස අවුරුදු 70 ට වැඩි පුරවැසියන් සඳහා දීමනාව/ වයස අවුරුදු 100 ට වැඩි පුරවැසියන් සඳහා දීමනාව ලබාදීම	දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් සියල්ල සඳහා සමෘද්ධි සහනාධාර/ වකුගඩු ආධාර/ ආබාධිත දීමනා/ වයස අවුරුදු 70 ට වැඩි පුරවැසියන් සඳහා දීමනාව/වයස අවුරුදු 100 ට වැඩි පුරවැසියන් සඳහා සහනාධාර ලබාදීම(සමෘද්ධි ලාභීන්/ අඩු ආදායම්ලාභීන්) * 100			√
කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂනයක් අත්පත් කර ගැනීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	2024 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අඹ නිෂ්පාදන ගම්මාන ඇති කිරීම	අඹ පැල ලබාදුන් පවුල් සංඛ්‍යාව / අඹ පැල ලබාදීමට සැලසුම් කළ පවුල් සංඛ්‍යාව * 100			√
	2024 වර්ෂයේ ලෝක ආහාර වැඩසටහන යටතේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා එළවන් ලබාදීම	එළවන් ලබාදුන් පවුල් සංඛ්‍යාව / එළවන් ලබාදීමට සැලසුම් කළ පවුල් සංඛ්‍යාව * 100			√
	වී ගොවිතැන ප්‍රමුඛ කෘෂි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා කාබනික වගාවේ අස්වැන්න පාරිභෝජනයට යොමු කිරීම සඳහා බීජ පැල ලබා දීම	බීජ පැල ලබාදුන් පවුල් සංඛ්‍යාව / බීජ පැල ලබාදීමට සැලසුම් කළ පවුල් සංඛ්‍යාව * 100			√
නිරෝගි ජීවිතයක් තහවුරු කිරීම හා සියලු දෙනාට, සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	පෙර පාසල් දරුවන්, පාසල් දරුවන් සඳහා පෝෂ්‍යදායී ආහාර වේල් ලබා දීම.	පෝෂ්‍යදායී ආහාර වේල් ලබා දුන් දරුවන් සංඛ්‍යාව/ පෝෂ්‍යදායී ආහාර වේල් ලබා දීමට සැලසුම් කළ දරුවන් සංඛ්‍යාව* 100			√
සමාන හා අන්තර්ග්‍රහණීය (සියලු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) වූ අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම හා සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම	දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් සලසා දීම. පාසල් ළමුන් හා පාසල් හැර ගිය ළමුන් අඛණ්ඩ අධ්‍යාපනයක් සඳහා යොමු කිරීම	අවධානයට ලක්වූ ළමුන් සංඛ්‍යාව / අඛණ්ඩ පාසල් අධ්‍යාපනය සඳහා යොමු කල ළමුන් සංඛ්‍යාව * 100			√
	පරිවාස හා ළමා ආරක්ෂක නිලධාරීන් මගින් ළමා සමාජ හා ළමා සභා පිහිටුවීම	පිහිට වූ ළමා සමාජ හා ළමා සභා සංඛ්‍යාව / පිහිටවීමට සැලසුම් කළ ළමා සමාජ හා ළමා සභා සංඛ්‍යාව *		√	

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්කර ගැනීම සහ කාන්තාවන් හා ගැහැණු දරුවන් බල ගැන්වීම	2024 වර්ෂයේ මිනිස් බල හා රැකී රක්ෂා කටයුතු දෙපාර්තමේන්තුව/ කාන්තා කටයුතු අමාත්‍යාංශය මගින් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව * 100			√
සැමට ජලය ලැබීම හා තිරසාර ජල කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම	2024 වර්ෂයේ දිස්ත්‍රික්කයේ සියලුම පවුල් සඳහා පිරිසිදු පානීය ජලය ලබාදීමට පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	පිරිසිදු පානීය ජලය ලබාදුන්පවුල් සංඛ්‍යාව / පිරිසිදු පානීය ජලය ලබාදීමට සැලසුම් කළ පවුල් සංඛ්‍යාව * 100		√	
	2024 වර්ෂයේ ප්‍රති ආශ්‍රිතකරණ ජල පෙරණ ස්ථාපනය කර පිරිසිදු ජලය ලබාදීම	ස්ථාපනය කරන ලද ප්‍රති ආශ්‍රිතකරණ පෙරණ සංඛ්‍යාව/ ස්ථාපනය කිරීමට සැලසුම් කළ ප්‍රති ආශ්‍රිතකරණ පෙරණ සංඛ්‍යාව*100			√
සැමට ලබාගත හැකි විශ්වාසනීය තිරසාර සහ නවීන කාලීන බලශක්තියට ප්‍රවේශ තහවුරු කිරීම	2024 වර්ෂයේ ඉංජිනේරු අංශය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය නව ගොඩනැගිලි සංකීර්ණයේ සූර්යය බල විදුලි පද්ධති ස්ථාපනය කිරීම	ස්ථාපනය කරන ලද සූර්යය බල විදුලි පද්ධති සංඛ්‍යාව/ සවිකරීමට සැලසුම් කළ සූර්යය බල විදුලි පද්ධති සංඛ්‍යාව*100			√
දරාගත හැකි, අන්තර්ග්‍රහණීය සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායි රැකියාවක් හා සැමට ගෞරවාන්විත වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම	2024 වර්ෂයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් ස්වයං රැකියා ලාභීන් සහ කර්මාන්ත කරුවන් සවිබල ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සේවා නියුක්තිකයන් වැඩි කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව * 100			√
ප්‍රත්‍යාස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මීකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදන ධෛර්යමත් කිරීම	සංචාරක ව්‍යාපාරයට අදාල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩ සටහන් සංඛ්‍යාව * 100			√
	2024 වර්ෂයේ සැලසුම් අංශය මගින් එක්සත් ජාතින්ගේ සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහයෙන් පහසුවෙන් සේවාවන් ලබා ගැනීම සඳහා මෘදුකාංග නිර්මාණය කිරීමේ වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව * 100			√
නගර හා මානව ජනාවාස අන්තර්ග්‍රහණය, ආරක්ෂිත ප්‍රත්‍යාස්ථ හා තිරසාර බවට පත්කිරීම	2024 වර්ෂයේ නව නගර සංවර්ධන සැලැස්මට අනුව දිස්ත්‍රික්කයේ අනෙකුත් ආයතන සමග සම්බන්ධ වී සංවර්ධන කටයුතු සිදුකිරීම	ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව / සැලසුම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව * 100		√	

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
තිරසාර පාරිභෝජන හා නිෂ්පාදන රටාවක් ඇති කිරීම	ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම සඳහා උඳු/මුං භෝග වගා කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	ආධාර ලබා දුන් පවුල් සංඛ්‍යාව / ආධාර ලබාදීමට සැලසුම් කළ පවුල් සංඛ්‍යාව * 100			√
	අතිරේක ආහාර බෝග නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම යටතේ බිම්මල් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ මූල්‍යාධාර ලබාදීම	ආධාර ලබා දුන් පවුල් සංඛ්‍යාව/ ආධාර ලබාදීමට සැලසුම් කළ පවුල් සංඛ්‍යාව * 100			√
	ලෝක ආහාර වැඩසටහන යටතේ ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව * 100			√
	2024 වර්ෂයේ කාබනික පොහොර භාවිතයෙන් තම පරිභෝජනය සඳහා ගෙවතු සකස් කිරීමට අවශ්‍ය පුහුණු උපදෙස් හා පහසුකම් ලබා දීම	සකස් කළ ගෙවතු සංඛ්‍යාව / සැලසුම් කළ ගෙවතු සංඛ්‍යාව * 100			√
භෞමික පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැලැක්වීම, භූමි හායනය වලක්වා එය ප්‍රතිවර්තනය කිරීම හා ජෛව විවිධත්වය අහිමි වීම නැවැත්වීම	2024 වර්ෂයේදී ලෝක පරිසර දිනයට සමගාමීව පැළ සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව * 100			√
	2024 වර්ෂයේ පාරිසරික උද්‍යාන සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව * 100			√
දේශගුණික වෙනස්කම් සහ එහි බලපෑම් වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම	2024 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමට හැකි මට්ටමින් ජනතාව සවිබල ගැන්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව * 100			√
තිරසාර සංවර්ධනය සඳහා වූ සාමකාමී හා අන්තර්ග්‍රහණය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණය සඳහා ප්‍රවේශ සැපයීම හා වගකීමක් සහිත අන්තර්ග්‍රහණය වූ ආයතන සෑම මට්ටමකම ස්ථාපිත කිරීම	2024 වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති කාර්යාල අධීක්ෂණය හා එම ආයතන මගින් සපයන සේවාවන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම මට්ටමට පත්කිරීම	පවත්වන ලද කාර්යාල පරීක්ෂණ සංඛ්‍යාව / පැවැත්වීමට සැලසුම් කරන ලද කාර්යාල පරීක්ෂණ සංඛ්‍යාව * 100			√
	2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම	පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු සංඛ්‍යාව / සැලසුම් කරන ලද විගණන කළමනාකරණ කමිටු සංඛ්‍යාව * 100			√
	2024 වර්ෂයේ සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව / සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව * 100			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර

- කෘෂි නව්‍යකරණ වැඩසටහන ඔස්සේ ගොවීන්ට, පොලී රහිත ණය ලබා දීම, වගාවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ පැල වර්ග ලබා දීම, තරුණ කෘෂි ව්‍යාපෘති ගම්මාන බිහිකිරීම තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රජාව දිරිගැන්වීමත් ඒ තුළින් ආදායම් මාර්ග උත්පාදනය කිරීමටත් හැකි විය.
- ආහාර සුරක්ෂිතතාව හා තාක්ෂණ වැඩසටහන යටතේ අතිරේක ආහාර වගා කරන ගොවීන් සඳහා වතුර මෝටර් ලබාදීම, එළුවන් ලබාදීම, උදු/මුං හෝග වගා ව්‍යාපෘතිය, බිම්මල් නිෂ්පාදනය, ව්‍යාපෘති මගින් ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සහ එමගින් අමතර ආදායමක් ලබා ගැනීමට සහ ගුණාත්මක පෝෂණයෙන් ඉහළ සතත්ත්ව නොවන ප්‍රෝටීන ප්‍රභවයන් වෙළඳ පොළට ඉදිරිපත්කිරීමට හැකිවිය.
- සංචාරක නියෝජිත ආයතන සමඟ සම්බන්ධ කරමින් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සංචාරක ආකර්ෂනීය පරිසරයක් නිර්මාණය කිරීමට හැකි විය.
- ළමා කටයුතු, කාන්තා කටයුතු, මුල් ළමාවිය සංවර්ධන හා ළමා හිමිකම් ප්‍රවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් විසින් දිස්ත්‍රික්කය පුරාවට ළමා අපචාර පිළිබඳ, කාන්තා හිංසනය පිළිබඳ, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ විවිධ වැඩසටහන් හා දැනුවත් කිරීම් සිදු කරමින් ළමා සංවර්ධනය හා කාන්තාවන් සවි බල ගැන්වීම සිදු කර ඇත.
- අඩු ආදායම් ලාභීන් හා රැකියා වියුක්තිකයන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම සඳහා පුහුණුව හා ණය ආධාර ලබා දෙමින් දිස්ත්‍රික්කයේ බොහෝ පිරිසක් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට කුඩා ව්‍යාපාර අංශය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හරහා හැකි විය.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	41	30	11
තෘතීයික	22	14	8
ද්විතියික	982	806	176
ප්‍රාථමික	92	89	03

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හි නිලධාරීන් පසුගිය කාලසීමාවේ දේශීය හා විදේශීය නිවාඩු ලබාගැනිම හේතුවෙන් ඉහළ ගිය මානව සම්පත් ඌණතාවයන් හමුවේ, පවතින මානව සම්පත උපයෝජනය කරගනිමින් එකී කාර්යයන් සියල්ල ආවරණය කරගැනීමට ගත් ප්‍රයත්නය සාර්ථක වී ඇත. එසේ වුවද , නිලධාරියෙකුගේ උපරිම ධාරිතාවය ඉක්මවා කාර්යයන් පැවරූ කල්හි කාර්යක්ෂමතාවයෙහි අඩුවීමක් සිදුවීම නොවැළැක්විය හැක්කකි. එබැවින්, පුරප්පාඩු සම්පූර්ණ කිරීම තුළින් වඩා සාධනීය සහ තිරසාර විසඳුමක් ලබාගැනීම වඩා සුදුසු වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
කළමනාකරණ සේවා නිළධාරි I ශ්‍රේණියේ නිළධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීමේ වැඩමුළුව	21	දින 10	72,005.00	-	දේශීය	තම රාජකාරි ක්ෂේත්‍රය තුළ දැනුම වර්ධනය කරගැනීම.
සංවර්ධන නිළධාරී කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා උපකාරක සම්මන්ත්‍රණය	52	දින 01	-	-	දේශීය	තම රාජකාරි ක්ෂේත්‍රය තුළ දැනුම වර්ධනය කරගැනීම.
ලිපි කළමනාකරණය පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුව	161	දින 01	-	-	දේශීය	රාජකාරි ලිපි ලිවීම පිළිබඳ දැනුම යාවත්කාලීන කරගැනීම.
සයිබර් ආරක්ෂණ ධාරිතා ගොඩනැඟීමේ වැඩසටහන	70	දින 01	62,603.00	-	දේශීය	රාජ්‍ය නිළධාරීන් වෙත සයිබර් ආරක්ෂණ පද්ධතිය පිළිබඳ මූලික දැනුම ලබාදීම.
සංඥා භාෂා පුහුණු වැඩසටහන	15	දින 10	5,000,000.00	-	දේශීය	සමාජ සේවා නිළධාරීන් 15 දෙනෙකුගේ සංඥා භාෂා දැණුම වර්ධනය කිරීම තුළින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කථන , ශ්‍රවණ ආබාධ සහිත 400 ක පමණ පිරිසකගේ සමාජ අයිතිවාසිකම් සුරක්ෂිත කරලීම.

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

- කිසියම් ආයතනයක පරමාර්ථ සාධනය කෙරෙහි බලපාන සාධක අතුරින් පුහුණුව, ධාරිතා සහ ආකල්ප සංවර්ධනය තුළින් අසීමිතව දියුණු කළ හැකි එකම සාධකය මානව සම්පත පමණි.

- දිනෙන් දින යාවත්කාලීන වන තාක්ෂණික, ශිල්පීය සහ න්‍යායික ප්‍රායෝගික දැනුම ආයතනයෙහි මානව සම්පත වෙත සම්ප්‍රේෂණය වන පුහුණු පාඨමාලා , වැඩමුළු සහ ක්‍රියාකාරකම් තුළින් දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප වලින් පිරිපුන් කාර්ය මණ්ඩලයක් වෙතින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් අපේක්ෂා කළ හැකිය.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.6	වෙනත්	අදාල නොවේ.		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරු ව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාර , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරු ව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ණය ශේෂ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග අවසන් වී නොතිබීම	ඉදිරි ක්‍රියාමාර්ග අවසන් වූ පසු ඒ අනුව කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කොට තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NCCG/PL/A/DSPL/FS/2024 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 30 දින

දිස්ත්‍රික් ලේකම් / ගණන්දීමේ නිලධාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව

ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.6.1 මූල්‍ය නොවන වත්කම්.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අයත් නිල සෙවන ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) වැඩ අවසන් නොවූ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම I, II, III අදියරවලට අදාළව මෙතෙක් දරා තිබූ සම්පූර්ණ වියදම රු. 2,024,400,826 ක් වුවත්, කෙරීගෙන යන වැඩ යටතේ රු.1,893,160,746 ක් පමණක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු.131,240,080 ක වෙනසක් වූ අතර, එම වෙනස හඳුනා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ අදියර III හි ගෘහ භාණ්ඩ සපයා ගැනීම යටතේ පිරිවිතර හා භාණ්ඩ භාරදීමේ ලියකියවිලි, සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් සිදු කරන ලද වියදම් රු.283,420,545 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඇ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම් ගිවිසුම් ගත කාල සීමාවේ දී ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් පසුව ඇති වූ මිල ඉහළ යාම සඳහා පළමු, දෙවන හා තෙවන අදියරයන් සඳහා පිළිවෙලින් රු.39,402,202 ක්, රු.92,438,679 ක් හා රු.23,567,739 ක් ලෙස එකතුව රු.155,408,620 ක මිල විචලනයන් (Price Escalation) සඳහා ගෙවීම් කර තිබූ අතර, අදාළ ගණනය කිරීම්වල නිරවද්‍යතාව තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

02. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

03. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

3.1.1 ආදායම් සහතික නිකුත් කිරීම

1997 ජනවාරි 13 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 102 දරන ප්‍රාදේශීය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ආදායම් වාර්තා සහතික නිකුත් කිරීමේ දී එම ආදායමෙන් සියයට 1 ක ගාස්තු අයකළ යුතු අතර, 1997 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 351 ප්‍රකාරව එම ගාස්තු සියයට 10 කින් වැඩි කළ යුතුවේ. 2001 මාර්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 359 ප්‍රකාරව අයකරන ගාස්තු සියයට 15 කින් වැඩිකළ යුතු වන අතර, ඒ අනුව ආදායම් සහතික සඳහා අයකරන ගාස්තුව සියයට 1.265 ක් (සියයට 1 * සියයට 10 * සියයට 15) විය යුතු නමුත්, සියයට 0.265 ක් අඩුවෙන් ආදායම් සහතික මත ගාස්තු අයකර තිබීම නිසා 2024 වර්ෂයේ රු.මිලියන1,940 ක ආදායමක් අහිමි වී තිබුණි.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙත ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා 2016 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලැබී තිබුණි. ප්‍රතිපාදන හා වියදම් සැසඳීමේ දී ප්‍රතිපාදන මුදලින් සියයට 4 සිට සියයට 54 අතර ප්‍රමාණයකින් ඉතිරිවීම් සිදු වී තිබුණි.

3.3 බලය නොලත් කාරක පාඩු

(අ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ අදියර I, II,III සඳහා බිල්පත් අනුව පිළිවෙලින් රු.132,210,449 ක, රු.139,310,520 ක හා රු.11,512,760 ක විවලනයන් ලෙස එකතුව රු.283,033,729 ක් ගණනය කර තිබුණු අතර, එම සියයට 10 සීමාව ඉක්මවා සිදුවූ විවලනයන් සඳහා ගෙවීම් කර තිබූ නමුත්, ඒ සඳහා ලබා ගත් විශේෂ අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අදියර II සහ III වෙනුවෙන් විවලනයන් සඳහා සිදු කළ ගෙවීම් අවස්ථා 03 ක දී පිළිවෙලින් රු. 6,769,310 ක් හා රු. 6,216,680 ක් ලෙස එකතුව රු.12,985,990 ක් විවලන නියෝග (Variation Oder) ඉදිරිපත් නොකර ගෙවීම් කර තිබුණි.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
II කාණ්ඩය XLVIII පරිච්ඡේදයේ 1:2 වගන්තිය පරිදි පළමු උපලේඛනය	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ අදියර II සඳහා වූ බිල්පත් අංක 11 හි බිල්පත් වටිනාකම රු.333,433,271 ක් වුවත්, බිල්පත් අංක 12 හි පෙර ගෙවන ලද වටිනාකම රු.328,893,184 ක් ලෙස දක්වා රු.4,540,087 ක් වැඩියෙන් ගෙවීම් කර තිබීම සම්බන්ධයෙන් කරන ලද විගණන විමසුම සඳහා 2025 මැයි 30 දින වන විටත් පිලිතුරු ලබා දී නොතිබුණු අතර, අධි ගෙවීම් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

3.6 තැන්පතු

වර්ෂ 05 ක් ඉක්ම වූ හා වර්ෂ 02 ක් ඉක්ම වූ පිළිවෙලින් රු.164,521,969 ක හා රු.32,230,462 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.7 අධිභාර

පොළොන්නරුව නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීම අදියර II හි අංක 12/02 දරන හා 2023 දෙසැම්බර් 01 දිනැති වවුචරය මඟින් 36 වන බිල්පතට අනුව රු.9,314,986 ක් ගෙවා තිබුණි. එම වවුචරය සඳහා නිර්දේශ කර තිබූ විවලන වටිනාකම රු.796,752 ක් හා සමුච්චිත අගය රු.134,751,987 ක් වුව ද, සමුච්චිත අගය රු.135,751,987 ක් ලෙස සටහන් කර බිල්පත සැකසීම හේතුවෙන් රු.1,000,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගයන් කාර්යාලය විසින් ගෙන නොතිබුණි.

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණ භූමිය තුළ නීතිඥ කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කර එම ගොඩනැගිලි ටෙන්ඩර් පදනම මත ලබා දී එමඟින් මාසික කුලී ආදායමක් ප්‍රාදේශීය සභාව වෙත අයකර ගැනීමට සැලසුම් කර තිබූ අතර, එම ඉඩම හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පවරාදීම පිළිබඳව අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කිසිදු විරෝධතාවක් නොමැති බවට 2019 ජූලි 27 දිනැති අංක MOJ/DEV/02/LAND/25/09 දරන ලිපිය මඟින් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇතත්, එම ඉඩමේ පැවරීම් කටයුතු වර්ෂ 06 ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ගැමිදිරිය ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06 ක ග්‍රාමීය සංවිධාන 160 ක් පිහිටුවා ඇති අතර, එම ග්‍රාමීය සංවිධාන වෙත රු. 517,780,000 ක මුදලක් ලබා දී තිබුණි. එම ග්‍රාමීය සංවිධාන හඳුනාගෙන ඒවායේ අධික්ෂණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නමුත්, එවැනි අධික්ෂණයක් නොවීම හේතුවෙන් වර්තමානය වනවිට ඇතැම් සංවිධාන අක්‍රිය වී තිබුණු අතර, අදාළ සමිති හඳුනාගෙන එම සමිති සක්‍රිය කිරීමටත් බැංකු ගිණුම්වල හා විවිධ පාර්ශව සතුව පවතින මුදල් නැවත එම සමිතිවල අරමුණු සඳහා යොමුකර ගැනීමටත් කටයුතු කර නොතිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දිනට හඳුනා ගෙන තිබූ අක්‍රිය බැංකු ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.56,640,061 ක් විය.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු නිම කළයුතු බවට මුලින් අපේක්ෂා කළ දිනය ඉක්මවා වර්ෂ 06 ක කාල පරිච්ඡේදයක් ගතවී ඇතත්, අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබාගෙන නොතිබුණි.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) ගම් සමඟ පිළිසඳර 2022 ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ පවුල් ඒකක සඳහා කිකිළි පැටවුන් ලබාදීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය හා බිත්තර ලබාගැනීම තුළින් පවුලේ පෝෂණය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පවුල් ඒකක වෙත රු.මිලියන11.6 ක් වටිනා කිකිළි පැටවුන් 28797 ක් ලබා දී තිබුණි. එයින් රු.මිලියන 09 ක් වටිනා කිකිළි පැටවුන් 22265 ක් මියයාම වෙනුවෙන් නැවත කිකිළි පැටවුන් ලබාදීමට සැපයුම්කරු සමඟ ගිවිසුම්ගතවී ඇතත්, සමාලෝචිත වර්ෂයේ දී කිකිළි පැටවුන් 3959 ක් පමණක් ලබා දී තිබුණි.

(ආ) 2000 වර්ෂයේදී වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සුව සේවා පදනම මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් හා පානීය ජල පහසුකම් සැපයීමේ අරමුණ වෙනුවෙන් පිහිටුවන ලද අරමුදලේ 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන11.23 ක් පැවති අතර, අරමුදල අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා නොකර වර්ෂ 24 ක කාල සීමාවක සිට බැංකුවේ නිෂ්ක්‍රීයව පවතින නමුත්, අදාළ අරමුණු වෙනුවෙන් යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2000-2007 වී මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් විවිධ අත්තිකාරම් යටතේ ලබා දී තිබූ රු.මිලියන 42.13 ක මුදල වසර 21 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, පියවීමෙන් තොරව හානි පාඩු ප්‍රකාශනයෙහි තවදුරටත් කපා හැරීමට ඇති ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ඈ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීම් මත 2019/20 මහ කන්නයේ සිට 2022/23 මහ කන්නය දක්වා ක්‍රියාත්මක කරන ලද වී මිලදී ගැනීමේ වැඩසටහන් යටතේ රජයට ලැබිය යුතු සහල් කිලෝග්‍රෑම් 2,563,910 ක් ලබා නොදීම හේතුවෙන් රු.209,723,844 ක මුදලක් තවදුරටත් අයකර ගත යුතුව පැවතුණි.

4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති - විමධ්‍යගත අරමුදල්

විමධ්‍යගත අයවැය වැඩසටහනට අදාළව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කළ 2023 දෙසැම්බර් 29 දිනැති යොමු අංක NPD/DCB/2024/GEN දරන හා අංක MF/02/2023 දරන මුදල් අමාත්‍යාංශ වක්‍රලේඛය ප්‍රකාරව නිවැරදි ග්‍රාමීය සංවර්ධනය ප්‍රවේශයක් තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කරමින් රටේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම මූලික අරමුණ ලෙස දැක් වුව ද, ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති තුළින් එම අරමුණු ඉටු කරගැනීමේ ප්‍රමුඛ හැකියාවක් සහිත ස්වරූපයේ නොවන ව්‍යාපෘති 553 ක් වෙනුවෙන් රු.70,243,968 ක මුදලක් වැයකර තිබුණි. එම ගෙවීම් තුළ ප්ලාස්ටික් පුටු මිලදී ගැනීමේ කටයුතු වෙනුවෙන් රු.24,207,328 ක මුදලක් වැය කර තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) ඇලහැර, හිඟුරක්ගොඩ, ලංකාපුර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූල්‍ය නොවන වත්කම්වල ලෙජර් ශිණුම් අංක - 9153 යටතේ ශිණුම්ගත කර ඇති රු.මිලියන143.94 ක් වටිනා ඉඩම්වල ස්ථිර අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් හඳුනා ගැනීමට කේත අංකයක් භාවිතා කළද එම කේත අංකය හා සිගාස් පද්ධතියේ ඇතුළත් කේත අංකය එකිනෙකට නොසැසඳෙන බැවින් භාණ්ඩ අපහරණයේ දී හා වෙන්දේසි කිරීමේ දී පද්ධතියෙන් ඉවත්කළ යුත්තේ කුමන වත්කමද යන්න නිවැරදිව හඳුනා ගත හැකි පරිදි අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම්ගේ නමට හා ප්‍රාදේශීය ලේකම්වරුන් තිදෙනෙකුගේ නමට අයත් ට්‍රැක්ටර් 06 ක් සහ බවුසර් 02 ක් විවිධ ආයතන වෙත මාස 06 ත් වර්ෂ 15 ත් අතර කාලයක් තුළදී පරිහරණය සඳහා ලබා දී ඇති නමුත්, එම වාහන නැවත කාර්යාලය වෙත ලබාගැනීමට හෝ එම ආයතන වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි. තව ද වෙන්දේසි කර ඇති නමුත් අයිතිය මාරු කර නොමැති යතුරු පැදියක් හා අපහරණය කර ඇති නමුත් අයිතිය අවලංගු නොකළ වාහන 02 ක් ද පැවතුණි.

(ඈ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය භාරයේ පවතින ට්‍රැක්ටර් 04 ක් සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින ට්‍රැක්ටර් 01 ක් හා බවුසර් ටෙලරයක් වර්ෂ 02 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

4.4 පාඩු හා හානි

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය ඉදි කිරීමේ II වන හා III වන අදියර සඳහා ගෙවීම් කිරීමේ දී පිළිවෙලින් රු.3,000,690 ක හා රු.1,147,962 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එනමුත් කොන්ත්‍රාත්කරු විසින් වැඩ නිමකර භාරදීමේ කාල සීමාව විවිධ හේතූන් මත වසර 06 ක් දක්වා දීර්ඝ කරගෙන තිබුණු නමුත්, ඒ සඳහා ප්‍රමාද ගාස්තු අය කරගැනීමක් සිදු කර නොතිබුණි.

4.5 අනාර්ථික ගනුදෙනු

ගෘහ භාණ්ඩ හා උපකරණ ලබා ගැනීම සඳහා වූ අංක PDF/GOV/155/CM/456 දරන හා 2019 ජුනි 17 දිනැති අදියර III ට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අත්‍යාවශ්‍ය ගෘහ භාණ්ඩ මිල දී ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර, තවිටු 02 ඇඳන් හා මෙට්ට 26 ක් රු.1,823,250 කට මිල දී ගෙන තිබූ අතර, ඇඳන් 06 ක් භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි. තවද, මුළුතැන්ගෙයි උපකරණ රු.6,769,310 ක මිලකට 2023 වර්ෂයේ දී සපයා සවි කරගත් බවට තහවුරු කර ගෙවීම් කර තිබුණද, විගණිත දින වූ 2025 අප්‍රේල් 28 දින වන විටත් එම උපකරණ සවිකර නොතිබුණි.

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විමසුම් අංකය	නිකුත් කළ දිනය	වෙනත් විස්තර
POL/B/DSPL/2022/55/AQ/26	2022/11/08	දිස්ත්‍රික් ලේකම්ගේ පිළිතුරු ඉදිරිපත් නොකර උපදේශන ආයතනයේ අදහස් දැක්වීම් පිළිතුරු ලෙස යොමුකර තිබුණි.
NCCG/PL/A/DSPL/2024/AQ/23	2025/04/29	2025 මැයි 30 වන විටත් පිළිතුරු ලැබී නොමැත.

4.7 කළමනාකරණ දුර්වලතා

සමෘද්ධි ප්‍රජා මූල බැංකු 07 ක බොල්ණය අනුපාතය සියයට 11.46 - 47.17 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණු අතර, මෙම බොල් ණය තුළ පවතින අක්‍රමික ණය හඳුනාගෙන එම ණය අයකර ගැනීම හා ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

05. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් සංඛ්‍යාව 1137 ක් වූ අතර, තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව 939 ක් විය. අනුමත වූ කාර්ය මණ්ඩල විස්තර අනුව විධායක ශ්‍රේණියේ පුරප්පාඩු 11 ක් ද, තෘතියික ශ්‍රේණියේ පුරප්පාඩු 08 ක් ද, ද්විතික ශ්‍රේණියේ පුරප්පාඩු 176 ක් ද පැවතුණි.

එන්.එන්.කේ. දිවාකර,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති (වැ.බ) වෙනුවට.

ඩබ්. නෙළුම් කුමාර දිවාකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය